

# ක්ෂේත්‍ර සනීපාරක්ෂාව තුළින් නීරෝගි පේර වගාවක්

පේර වගාව රෝග හා පළිබෝධ හානි වලට වැඩිපුර ග්‍රාහී වීම නිසා වගාකරුවන්ට ලැබිය හැකි උපරිම ලාභය ලබා ගැනීමට අපහසුවී ඇත. එම නිසා වගාකරුවන් අධික ලෙස කෘෂි රසායනික ද්‍රව්‍ය භාවිතයට නැඹුරුවක් දක්වයි. මෙමඟින් පාරිභෝගිකයන්ගේ ශරීර සෞඛ්‍ය කෙරෙහි අහිතකර බලපෑමක් ඇති කරයි.

ක්ෂේත්‍ර සනීපාරක්ෂාව පවත්වා ගැනීමෙන් රෝග හා පළිබෝධ හානිය අඩු කරගත හැකි අතර එමඟින් රසායනික ද්‍රව්‍ය භාවිතයද අඩුකර ගත හැකිය.

**ක්ෂේත්‍ර සනීපාරක්ෂාව සඳහා පහත සඳහන් පිළිවෙත් අනුගමනය කරන්න.**

### 1. නීරෝගී රෝපණ ද්‍රව්‍ය භාවිතය

- නිරෝගී පැළ පමණක් වගාවට යොදන්න.
- කැප්ටාන්/තිරාම් වැනි දිලීර නාශකයකින් බීජ ප්‍රතිකාර කරන්න.
- පාංශු ජීවානුහරණය - පේර වගාවේ ප්‍රධානම රෝගකාරකයා මූල ගැටිති වටපනුවා වේ. මූලගැටිති වටපනු ආසාදනයන් වලක්වා ගැනීම සඳහා පහත ආකාරයකට තවාන් සැකසීමේදී පස ජීවානුහරණය කරන්න.
  - ✓ සූර්යාලෝකය මඟින්
  - ✓ රසායනික ද්‍රව්‍ය මඟින්

### 2. ගොවියා පිරිසිදුව සිටීම (පුද්ගල සනීපාරක්ෂාව)

- ක්ෂේත්‍රයේ කටයුතු ආරම්භ කිරීමට පෙර හා පසුව දෑත්, ඇඳුම් හා සපත්තු (පාවහන්) පිරිසිදු කර ගන්න.

### 3. පිරිසිදු උපකරණ භාවිතා කිරීම

- ක්ෂේත්‍ර කටයුතු සඳහා භාවිතා කරන උපකරණ හා මෙවලම් - පිහි, උදළු, කතුරු, ජලය යෙදීමට භාවිතා කරන මල් බාල්දි ආදී සුදුසු විෂබීජ නාශකයක් (රෙදි සෝදන කුඩු/සබන්) යොදා පිරිසිදු කරන්න.



### 4. වල් මර්ධනය

- ගස පාමුල වල් වලින් තොරව තබාගන්න.
- ගස අවට ක්ෂේත්‍රය තුළ වල් මර්ධනය කිරීම තණකොළ කපන යන්ත්‍ර ආධාරයෙන් සිදු කරන්නේ නම් පේර ශාක වල මුලට හානි නොවන ලෙස තණකොළ කපා ගන්න.

### 5. ආසාදිත ශාක කොටස් සහ බෝග අවශේෂ ක්ෂේත්‍රයෙන් ඉවත් කිරීම

- සියලුම ආසාදිත කොටස් - අතු, පත්‍ර, පැළ, ආදිය සහ බෝග අවශේෂ නිසි පරිදි ක්ෂේත්‍රයෙන් බැහැර කොට විනාශ කරන්න.
- මේ සඳහා වගා ක්ෂේත්‍රයේ කෙළවරක ගැඹුරු වලක් සකසා ගන්න. බැහැර කරනු ලබන ආසාදිත ශාක කොටස්, බෝග අවශේෂ, වල් පැළ ආදි ඒ තුළට දමා පුළුස්සා දමන්න. වර්ෂා කාලයකදී නම් පස් දමා ගැඹුරින් වල දමන්න.





## 6. කප්පාදු සහ පුහුණු කිරීම

- ශාක පහසු උසකින් පවත්වා ගැනීම හා සැකිල්ල මනාව පවත්වා ගැනීම සඳහා ශාක පහත ක්‍රමයට නිසි ලෙස කප්පාදු කරන්න.
    1. මධ්‍යස්ථ විවෘත කප්පාදු ක්‍රමය
    2. සැහැල්ලු කප්පාදු ක්‍රමය
- විශාල හොඳින් මේරූ අතු සඳහා කප්පාදු කියත ද මධ්‍යස්ථ අතු සඳහා ලූපර් උපකරණය ද කුඩා අතු රිකිලි සඳහා සෙකටියරය ද යොදා ගන්න. එක් ගසක් කප්පාදු කොට තවත් ගසක් කප්පාදු කිරීමට ප්‍රථම භාවිතා කළ උපකරණ විෂබීජහරණය කරන්න.
- කප්පාදුවෙන් පසු එම ආනත කැපුම් තලය මතුපිට සුදුසු දිලීර නාශකයක් ආලේපනය කරන්න.
- ශාක පුහුණු කිරීම සඳහා කුඤ්ඤ - ලණු භාවිතා කරන්න.

## 7. පොහොර යෙදීම

- පොහොර යෙදීමට පෙර පාංශු පරීක්ෂාවක් සිදු කරන්න. ඒ අනුව යෙදිය යුතු පොහොර ප්‍රමාණය තෝරා ගන්න.
- සාමාන්‍ය කොළ පැතිරී ඇති පරාසයට මායිම්ව පසෙහි නොගැඹුරු කාණුවක් කපා එයට පොහොර යොදා පස සමඟ හොඳින් මිශ්‍ර කර ප්‍රමාණවත් ලෙස ජලය සම්පාදනය කරන්න.

## 8. වැඩිපුර පවතින ඵල ඉවත් කිරීම

- පොකුරක වැඩිපුර ඇති ඵල මුල් අවධියේ කඩා ඉවත් කරන්න.

## 9. ඵල ආවරණ යෙදීම

- ඵල වර්ධනය වන මුල් අවදියේ (ආසන්න වශයෙන් විෂ්කම්භය සෙ.මී. 3- 4 තරම් ඵල) විශේෂිත සුදු පැහැති ආවරණ යොදන්න. අස්වනු නෙලන තෙක් ඒවා විවෘත නොකරන්න.



*ක්ෂේත්‍ර සනීපාරක්ෂක පිළිවෙත් අනුගමනය නොකළ පේර වගාවක්*



*ක්ෂේත්‍ර සනීපාරක්ෂක පිළිවෙත් අනුගමනය කළ පේර වගාවක්*


කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එක්ව ක්‍රියාත්මක කරන ශ්‍රී ලංකාව තුළ පලිබෝධනාශක හා පොහොර ආරක්ෂිතව හා නිවැරදි ලෙස භාවිතය ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මගින් සකසන ලදී

2025 නොවැම්බර්